Lesson 36

# There may be/ There might be
තියෙන්න පුළුවන්

මේ වාක්‍යය බලන්න

There is a problem here
මෙතන ප්‍රශ්නයක් තියෙනවා

දැන් අපිට කියන්න ඕන "මෙතන ප්‍රශ්නයක් තියෙන්න පුළුවන් " කියලා . විය හැකි බව හඟවන්න අපිට ඕන . එවිට ඉහත වාක්‍යයේ is වෙනුවට may be / might be යොදන්න පුළුවන්

There may be a problem here/ There might be a problem
මෙහි ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්

ඒ රටාවට තවත් උදාහරණ කීපයක් ගනිමු

There may be a delay due to bad weather
අයහපත් කාලගුණය නිසා ප්‍රමාදයක් තියෙන්න පුළුවන්

There might be a misunderstanding among them
ඔවුන් අතර වැරදි වැටහීමක් තියෙන්න පුළුවන්

There may be an issue with the plan.
සැලසුමේ ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්

There might be a mistake in the report.
රිපෝට් එකේ වරදක් තියෙන්න පුළුවන්

There may be a change in the schedule
ටයිම්ටේබල් එකේ වෙනසක් තියෙන්න පුළුවන්

There may be heavy traffic on the way
මග ගොඩාක් ට්‍රැෆික් තියෙන්න පුළුවන් (traffic - රථ වාහන )

There might be someone that can fix the engine around here
එන්ජින් එක පිළිසකර කරන්න දන්නා කෙනෙක් මේ අවට ඉන්න පුළුවන්

There might be someone who knows the answer
උත්තරය දන්නා කෙනෙක් ඉන්න පුළුවන්

There might be an opportunity for us here
අපිට මෙතන අවස්ථාවක් තියෙන්න පුළුවන්

There may be a power cut tonight.
අද රෑ විදුලි කප්පාදුවක් තියෙන්න පුළුවන්

There may be a reason behind his decision.
ඔහුගේ තීරණය පිටුපස හේතුවක් තියෙන්න පුළුවන්

There may be another way to solve this
මේක විසඳන්න වෙනත් ක්‍රමයක් තියෙන්න පුළුවන් (solve - සෝල්ව් - විසඳනවා)

There may be more work tomorrow
හෙට තව වැඩ වැඩියෙන් තියෙන්න පුළුවන්

There may be a problem with the internet
අන්තර්ජාලයේ ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්

- There could be … කියන රටාවත් තිබෙන්න පුළුවන් කියන අදහස දෙන්න පාවිච්චි වෙනවා.

There maya /might be / There could be යන මේ රටාවන් අතර ඉතා සියුම් වෙනස් කම් තිබෙනවා , නමුත් දැන් අපි ඒවා ගැන අවධානය යොමු කරන්නේ නැහැ . ඒ සියුම් වෙනස් කම් තිබුනත් මේවා ආසන්න වශයෙන් එකම තේරුම දෙන්නේ

There could be a problem here
මෙතන ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්

There could be a better solution to this problem.
මේ ප්‍රශ්නෙට මීට වඩා හොඳ විසදුමක් තිබෙන්න පුළුවන් ((better - බෙටර් - වඩා හොඳ )
(solution - සොලූෂන් - විසඳුම )

There could be a misunderstanding between them.
ඔවුන් අතර වැරදි වැටහීමක් තිබෙන්න පුළුවන්

There could be a delay due to the weather.
කාලගුණය නිසා ප්‍රමාදයක් තිබෙන්න පුළුවන් (delay - ඩිලේ - ප්‍රමාදය) (due to - ඩියු ටු - (හේතුව )මත)

There could be a reason why she didn’t answer.
ඇය පිළිතුරු දුන්නේ නැති එකට හේතුවක් තියෙන්න පුළුවන්

There could be a meeting in the afternoon.
හවස්වරුවේ රැස්වීමක් තියෙන්න පුළුවන්

There could be a power cut at any moment.
ඕනෑම මොහොතක විදුලි කප්පාදුවක් තියෙන්න පුළුවන්

There could be something wrong with the machine.
මැෂින් එකේ මොකක් හරි වරදක් තියෙන්න පුළුවන්

There could be an opportunity for us in the future
අනාගතයේදී අපිට අවස්තාවක් තියෙන්න පුළුවන්

හොදයි , ඉහත අපි මුලික උදාහරණ වාක්‍යය ලෙස ගත්තු “ප්‍රශ්නයක් තියෙනවා “ -There is a problem යන වාක්‍යය ම නැවත ගත්තොත් ,

- “ප්‍රශ්නයක් තිබෙනවා විය යුතුයි/ ප්‍රශ්නයක් තිබෙන්න ඕන” යන තේරුම දෙන්න There should be /There must be භාවිතා වෙනවා . එවිට අදහස් වෙන්නේ ඒ පවතින තත්වය මත යම් ප්‍රශ්නයක් තිබිය යුතු බව කථකයා ගේ අදහස බවයි

එහිදී There should be අර්ථ දෙකකින් භාවිතා වෙනවා . එකක් තිබිය යුතුයි කියලා කථකයා සිතන වීමේ හැකියාව .”මේ හරියේ කඩයක් තියෙන්න ඕන “ කියන තැනදී ඒ වීමේ හැකියාව හැඟවෙනවා. කථකයා හිතනවා “මේ හරියේ මිනිස්සු ගොඩක් ජීවත් වෙනවා , ඒ නිසා කඩයක් තිබිය යුතුයි කියලා එයා බලාපොරොත්තු වෙනවා. “Fridge එකේ කෑම ඉතුරු තියෙන්න ඕන “ කියන උදාහරනයේදීත් කථකයා අනුමාන කරනවා සහ බලාපොරෝත්තු වෙනවා එසේ තියෙන්න ඕන කියලා , මොකද එයාට මතකයි fridge එකට කෑම ගොඩක් එයා දැම්මා , ඒවා ඔක්කොම පාවිච්චි කරේ නැහැ කියලා
වෙනත් උදාහරණයකදී “ මෙතන තවත් ජනේලයක් තිබිය යුතුයි “ කියන තැන එයා නිර්දේශ කරනවා , එයා යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා එතන තවත් ජනේලයක් තිබිය යුතුයි කියන එක . There should be more buses during rush hour කියන උදාහරණයත් ඒ වගේ. ඔබට දැන් පැහැදිලි ඇති මේ කියන දෙය . අපි උදාහරණ ගෙන බලමු

There should be a shop nearby
මේ ළඟ පාත කඩයක් තියෙන්න ඕන

There should be another window here for better ventilation.
වඩා හොඳ වාතාශ්‍රය සදහා මෙහි තවත් ජනෙලයක් තිබිය යුතුයි (ventilation - වෙන්ටිලේෂන් - වාතාශ්‍රය )

There should be some food left in the fridge
ෆ්‍රිජ් එකේ කෑම ඉතුරු වෙලා තියෙන්න ඕන

There should be a solution to this problem
මේ ප්‍රශ්නෙට විසඳුමක් තියෙන්න ඕන

There should be more buses during rush hour
කාර්ය බහුල වෙලාවට තව බස් තියෙන්න ඕන

There should be someone to guide the visitors
අමුත්තන්ට මඟ පෙන්වන්න කෙනෙක් ඉන්න ඕනා

There should be enough chairs for everyone
හැමෝටම ඇතිවෙන්න පුටු තියෙන්න ඕනා

There should be a first-aid box in every classroom.
හැම පන්ති කාමරේම ප්‍රථමාධාර පෙට්ටියක් තියෙන්න ඕන

There should be another way to handle this situation.
මේ තත්වය හසුරුවන්න වෙන විදියක් තියෙන්න ඕන

There should be a train leaving soon
ඉක්මනින් පිටත්වෙන දුම්රියක් තියෙන්න ඕනා

There should be someone here who knows the way
පාර දන්න  කෙනෙක් මෙතන ඉන්න ඕන

There should be another "zero" here
මෙතන තව බින්දුවක් තියෙන්න ඕන

There must be - තිබිය යුතුයි - වලින් අදහස් වෙන්නේ වඩා ශක්තිමත් “වීමේ හැකියාව “. එය ශක්තිමත් නිගමනයක් . පවතින තත්වය හෝ කරුණු කාරනා මත කථකයා නිගමනය කරනවා “ තිබිය යුතුයි”  කියන එක. කථකයා මේ ප්‍රකාශය කරන්නේ ලොකු විශ්වාසයකින් . මෙය There may /might /should be වලට වඩා ලොකු වීමේ හැකියාවක් හඟවනවා

There must be a mistake here ( This price is too high )
මෙතන වැරැද්දක් තියෙන්න ඕන ( මේ මිල  හරි වැඩියි )

There must be someone outside ( I heard footsteps )
එළියේ කව්රු හරි ඉන්න ඕන( මට අඩි සද්ද ඇහුනා )

There must be a key for this lock.
මේ ලොක් එකට යතුරක් තියෙන්න ඕන

There must be something that is blocking the water flow.
වතුර එන එක වලක්වන යමක් තියෙන්න ඕන

There must be a reason why she left her husband
ඇය ඇගේ ස්වාමි පුරුෂයා දාල ගිය එකට හේතුවක් තියෙන්න ඕන

There must be a reason why the system stopped working suddenly.
සිස්ටම් එක හිටපු ගමන වැඩකරන එක නැවතුන එකට හේතුවක් තියෙන්න ඕන (හේතුවක් නැතුව එහෙම දෙයක් වෙන්නේ නැහැ )

There must be someone who knows what really happened there
එතන ඇත්තටම වුනේ මොකක්ද කියල දන්නා කෙනෙක් ඉන්න ඕන

There must be a water leak somewhere ( The floor is wet )
කොහේහරි වතුර කාන්දුවක් තියෙන්න ඕන ( පොලොව තෙතයි )

There must be a shortcut to get there faster
ඉක්මනින් එතනට යන්න ෂෝට් කට් එකක් තියෙන්න ඕන

There must be someone who saw the incident
සිද්ධිය දැකපු කෙනෙක් ඉන්න ඕන

There must be something wrong with this machine
මේ මැෂින් එකේ මොකක් හරි වරදක් තියෙන්න ඕන

Lesson 36

**SPOKEN ENGLISH**

මෙය විභාගයකට පසු සිදුවන කතා බහක් . මේවා සරල , ලස්සන වාක්‍යයන් . මේ තුල අඩංගු බොහෝ වාක්‍යයන් මේ කතා බහ තුල පමණක් නෙවෙයි වෙන වෙන අවස්ථා වලත් භාවිතා කල හැකි වාක්‍යයන්. ඒ නිසා ඒවා සියල්ලම හොදින් මතක තබා ගැනීම ඉතා වැදගත් . එලෙස කලොත් ඔබට වඩාත් පහසුයි සැබෑ ජිවිතයේ සංවාද වලදී අවශ්‍ය දෑ ඉක්මනින් ප්‍රකාශ කරන්න

A- How is the exam this time ?
හව් ඉස් දි එග්සෑම් දිස් ටයිම් ?
මේ පාර විභාගේ කොහොමද ?

Is the exam difficult ?
ඉස් දි එග්සෑම් ඩිෆිකල්ට් ?
විභාගේ අමාරුද ?

Is the exam difficult for you ?
ඉස් දි එග්සෑම් ඩිෆිකල්ට් ෆෝ යූ ?
ඔයාට විභාගේ අමාරුද ?

B- It's difficult
ඉට්ස් ඩිෆිකල්ට්
ඒක අමාරුයි

It's a bit difficult
ඉට්ස් අ බිට් ඩිෆිකල්ට්
ඒක ටිකක් අමාරුයි

It’s rather difficult
ඉට්ස් රාද(ර්) ඩිෆිකල්ට්
ඒක තරමක් අමාරුයි

It’s not easy
ඉට්ස් නොට් ඊසි
ඒක ලේසි නැහැ

It’s not easy at all
ඉට්ස් නොට් ඊසි ඇටෝල්
ඒක කොහෙත්ම ලේසි නැහැ

It’s more difficult than the last one
ඉට්ස් මෝ ඩිෆිකල්ට් දෑන් ද ලාස්ට් වන්
ඒක ගිය ගමන එකට වඩා අමාරුයි

It’s easy for me
ඉට්ස් ඊසි ෆෝ මී
මට ඒක ලේසියි

It’s not difficult at all
ඉට්ස් නොට් ඩිෆිකල්ට් ඇටෝල්
ඒක කොහෙත්ම අමාරු නැහැ

It’s easier than the last one
ඉට්ස් ඊසිය(ර්) දෑන් ද ලාස්ට් වන්
ඒක ගිය ගමන එකට වඩා ලේසියි

A- What subject was most difficult for you ?
වට් සබ්ජෙක්ට් වෝස් මෝස්ට් ඩිෆිකල්ට් ෆෝ යූ ?
මොන සබ්ජෙක්ට් එකද ඔයාට වැඩියෙන්ම අමාරු ?

B- Science was the most difficult
සයන්ස් වෝස් ද මෝස්ට් ඩිෆිකල්ට්
විද්‍යාව තමයි අමාරුම

A- What subject was the easiest?
වට් සබ්ජෙක්ට් වෝස් ද ඊසියස්ට්?
ලේසිම විෂය මොකක්ද?

B- English was the easiest.
ඉංග්‍රීෂ් වෝස් ද ඊසියස්ට්.
ඉංග්‍රීසි තමයි ලේසිම

Sinhala was easy too.
සිංහල වෝස් ඊසි ටූ.
සිංහලත් ලේසියි.

A: What about the paper today?
වට් අබවුට් ද පේප(ර්) ටුඩේ?
අද පේප(ර්) එක කොහොමද?

B: It's moderate. It wasn't easy or difficult.
ඉට්ස් මොඩරේට්. ඉට් වොස්න්ට් ඊසි ඕ ඩිෆිකල්ට්
ඒක මද්‍යස්තයි. ඒක ලේසිත් නෑ . අමාරුත් නෑ

A- Did you answer all the questions ?
ඩිඩ් යූ ආන්ස(ර්) ඕල් ද ක්වෙස්චන්ස් ?
ඔය ඔක්කොම ප්‍රශ්න වලට උත්තර ලිව්වද ?

B- Yes, I answered all the questions
යස් , අයි ආන්ස(ර්)ඩ් ඕල් ද ක්වෙස්චන්ස්
ඔව් , මම ඔක්කොම ප්‍රශ්න වලට උත්තර ලිව්වා

No, I couldn't. I didn't have time to memorize all the lessons
නෝ, අයි කුඩින්ට්. අයි ඩිඩින්ට් හෑව් ටයිම් ටු මෙමරයිස් ඕල් ද ලෙසන්ස්
නෑ, මට බැරි වුනා, මට වෙලාව තිබුනේ නෑ ඔක්කොම පාඩම් කට පාඩම් කරන්න
So I couldn't answer all the questions
සෝ අයි කුඩින්ට් ආන්ස්ව(ර්) ඕල් ද ක්වෙස්චන්ස්
ඒ නිසා මට ඔක්කොම ප්‍රශ්න වලට උත්තර දෙන්න බැරි වුනා

I had to omit some questions
අයි හැඩ් ටු ඔමිට් සම් ක්වෙස්චන්ස්
මට සමහර ප්‍රශ්න අත හරින්න උනා (omit - අත හරිනවා )

I didn't have time to answer all the questions
අයි ඩිඩින්ට් හෑව් ටයිම් ටු ආන්ස(ර්) ඕල් ද ක්වෙස්චන්ස්
මට වෙලාව තිබුනේ නැහැ ඔක්කොම ප්‍රශ්න වලට උත්තර ලියන්න

A- Did you answer the 4th question ?
ඩිඩ් යූ ආන්ස(ර්) ද ෆෝත් ක්වෙස්චන් ?
ඔයා හතර වෙනි ප්‍රශ්නෙට උත්තර ලිව්වද ?

B- I answered 5 out of 10 questions in it .
අයි ආන්ස(ර්)ඩ් ෆයිව් අවුට් ඔෆ් ටෙන් ක්වෙස්චන්ස් ඉන් ඉට්
මම ඒකෙ ප්‍රශ්න දහයෙන් පහකට උත්තර ලිව්වා

I missed to answer some of the questions
අයි මිස්ඩ් ටු ආන්ස(ර්) සම් ඔෆ් ද ක්වෙස්චන්ස්
මට සමහර ප්‍රශ්න වලට උත්තර ලියන්න මග හැරුනා

Forth question wasn’t difficult for me but the 6th one was
ෆෝත් ක්වෙස්චන් වෝස්න්ට් ඩිෆිකල්ට් ෆෝ මී බට් ද සික්ස්ත් වන් වෝස්
හතර වෙනි ප්‍රශ්නය මට අමාරු වුනේ නැහැ ඒත් 6 වැනි ප්‍රශ්නය අමාරු වුනා

It’s easier than I thought
ඉට්ස් ඊසිය(ර්) දෑන් අයි තෝට්
ඒක මම හිතුවට වඩා ලේසියි

A- How many marks will you get for Science ?
හව් මෙනි මාක්ස් විල් යූ ගෙට් ෆෝ සයන්ස්
ඔයාට විද්‍යාවට ලකුණු කීයක් ලැබෙයිද ?

B- More than 75
මෝ දෑන් සෙවන්ටි ෆයිව්
75 ට වඩා

Not more than 65
නොට් මෝ දෑන් සික්ස්ටි ෆයිව්
65කට වැඩිය නැහැ

I will be happy if I can get 55
අයි විල් බී හැපී ඉෆ් අයි කැන් ගෙට් 55
මට 55ක් ගන්න පුළුවන් වුනොත් මම සතුටු වේවි

A- Are you sure you will get more than 75 ?
ආ යූ ෂුව(ර්) යූ විල් ගෙට් මෝ දෑන් සෙවන්ටි ෆයිව් ?
ඔයාට විශ්වාසද ඔයාට 75කට වඩා ලැබෙයි කියලා ?

B-I am sure I will get more than 75
අයෑම් ෂුව(ර්) අයි විල් ගෙට් මෝ දෑන් සෙවන්ටි ෆයිව්
මට විශ්වාසයි මට 75 ට වඩා තියෙයි කියලා

I will have less than 55 in Science.
අයි විල් හෑව් ලෙස් දෑන් ෆිෆ්ටි ෆයිව් ඉන් සයන්ස්
මට විද්‍යාවට 55ට අඩුවෙන් තියෙයි

I will not have more than 55.
අයි විල් නොට් හෑව් මෝ දෑන් ෆිෆ්ටි ෆයිව්
මට 55කට වැඩියෙන් තියෙන එකක් නැහැ

I will not get many marks.
අයි විල් නොට් ගෙට් මෙනි මාක්ස්
මට ගොඩක් ලකුණු ලැබෙන එකක් නැහැ

I cannot hope for good marks
අයි කැනොට් හෝප් ෆෝ ගුඩ් මාක්ස්
මට හොද ලකුණු තියෙයි කියලා බලාපොරොත්තු තියන්න බැහැ

A- How did you feel after the exam?
හව් ඩිඩ් යූ ෆීල් ආෆ්ට(ර්) දි එග්සෑම්?
විභාගෙට පස්සේ ඔයාට හැඟුණේ කොහොමද?

B- I felt relieved.
අයි ෆෙල්ට් රිලීව්ඩ්
මට සැහැල්ලුවක් දැනුනා

I am not happy
අයෑම් නොට් හැපී
මම සතුටු නැහැ

I felt happy because I did well.
අයි ෆෙල්ට් හැපී බිකෝස් අයි ඩිඩ් වෙල්.
මට සතුටුයි මම හොඳට කළ නිසා

I am worried, I am worried about the results
අයෑම් වොරීඩ්, අයෑම් වොරීඩ් අබවුට් ද රිසල්ට්ස්
මම හිත් කනස්සල්ලෙන්, ප්‍රතිපල ගැන මම හිත් කනස්සල්ලෙන් ඉන්නේ

A- How did your friends do?
හව් ඩිඩ් යුව(ර්) ෆ්‍රෙන්ඩ්ස් ඩූ?
ඔයාගේ යාලුවෝ කොහොමද කරේ ?

B- They said it was easy.
දේයි සේඩ් ඉට් වොස් ඊසි.
ඔවුන් කිව්වෙ ඒක ලේසියි කියලා

It was difficult for some of them
ඉට් වෝස් ඩිෆිකල්ට් ෆෝ සම් ඔෆ් (සමොෆ්) දෙම්
සමහර අයට ඒක අමාරු වුණා.

One of my friends couldn't finish the paper.
වන් ඔෆ්(වනොෆ් ) මයි ෆ්‍රෙන්ඩ්ස් කුඩන්ට් ෆිනිෂ් ද පේප(ර්).
මගේ යාලුවෙකුට පේප(ර්) එක ඉවර කරන්න බැරි වුණා.

A- Did you study well before the exam?
ඩිඩ් යූ ස්ටඩි වෙල් බිෆෝ ද එග්සෑම්?
විභාගයට පෙර ඔයා හොඳට පාඩම් කළාද?

B- Yes, I studied every day.
යස්, අයි ස්ටඩීඩ් එවරි ඩේ.
ඔව්, මම හැමදාම පාඩම් කළා.

No, I didn’t study enough.
නෝ, අයි ඩිඩ්න්ට් ස්ටඩි ඉනෆ්.
නෑ, මම ප්‍රමාණවත් තරම් පාඩම් කළේ නෑ.

I studied only the important lessons.
අයි ස්ටඩිඩ් ඕන්ලි ද ඉම්පෝටන්ට් ලෙසන්ස්.
මම වැදගත් පාඩම් විතරයි පාඩම් කළේ

A- When will you get your marks ?
වෙන් විල් යූ ගෙට් යුව(ර්) මාක්ස් ?
ඔයාගේ ලකුණු ලැබෙන්නේ කවද්ද?

B- Maybe day after tomorrow
මේ බී ඩේ ආෆ්ට(ර්) ටුමෝරෝ
සමහර විට අනිද්දා

I think we’ll get them tomorrow
අයි තින්ක් වීල් ගෙට් දෙම් ටුමෝරෝ
මම හිතන්නේ අපිට හෙට ලැබෙයි

A- Are you happy with your performance this time?
ආ යූ හැපී විත් යුව(ර්) ප(ර්)ෆෝමන්ස් දිස් ටයිම්?
මේ පාර ඔයා කල විදිය ගැන සතුටුද? (performance - ඉෂ්ට කිරීම , ඉටු කිරීම , කාර්ය සාධනය)

B- Not at all
නොටැට් ඕල්
කොහෙත්ම නැහැ

Yes, I did my best.
යස්, අයි ඩිඩ් මයි බෙස්ට්
ඔව්, මම හැකි තරම් හොඳට කළා.

Not really. I could have done better.
නොට් රියලි. අයි කුඩ් හෑව් ඩන් බෙට(ර්).
ඇත්තෙන්ම නෑ. මට තවත් හොඳට කරන්න පුළුවන්කම තිබුනා

I’m satisfied with what I did.
අයෑම් සැටිස්ෆයිඩ් විත් වට් අයි ඩිඩ්
මම කළ දේ ගැන මම තෘප්තිමත්

I think I did okay.
අයි තිංක් අයි ඩිඩ් ඕකේ
මට හිතෙනවා මම හරියට කළා කියලා

I'm not fully happy, but it's alright.
අයෑම් නොට් ෆුලි හැපී, බට් ඉට්ස් ඕල් රයිට්
මම සම්පූර්ණයෙන්ම සතුටු නෑ, ඒත් අවුලක් නැහැ

I need to work harder next time.
අයි නීඩ් ටු ව(ර්)ක් හාඩ(ර්) නෙක්ස්ට් ටයිම්
මම ඊලග පාර තව මහන්සි වෙලා වැඩ කරන්න අවශ්‍යයි

I feel good about my performance.
අයි ෆීල් ගුඩ් අබවුට් මයි ප(ර්)ෆෝමන්ස්
මම කල විදිය ගැන මට සතුටුයි

**Vocabulary 36**

Due to – ඩියු ටූ – හේතුවෙන්

Engine – එන්ජින් – එන්ජිම

Power cut – පව(ර්) කට් – විදුලි කප්පාදුව

Footstep – ෆුට්ස්ටෙප් – පියවර

System – සිස්ටම් – පද්ධතිය

Easy – ඊසි – ලේසි

Easier – ඊසිය(ර්) – වඩා ලේසි

Easiest – ඊසියස්ට් – ලේසිම

Memorize – මෙමරයිස් – මතක තබාගන්නවා

Omit – ඔමිට් – අත් හරිනවා , මඟ හරිනවා

Moderate – මොඩරේට් – මධ්‍යම, මධ්‍යස්ත

Science – සයන්ස් – විද්‍යාව

Relieved – රිලීව්ඩ් – සැහැල්ලුවට පත්, සැනසීමට පත්

Perform – ප(ර්)ෆෝම් – කාර්යය කරනවා, ක්‍රියාත්මක කරනවා, ඉටු කරනවා ((මෙහි "ප " ශබ්ධ විය යුත්තේ "ප(ර්)ස්" කියන වචනයේ "ප " ශබ්ධ වන ආකාරයට . )

Performance – ප(ර්)ෆෝමන්ස් – කාර්ය සාධනය

Satisfy – සැටිස්ෆයි – තෘප්තිමත් කරනවා
Satisfied – සැටිස්ෆයිඩ් – තෘප්තිමත් වූ

Achieve – අචීව් – සාර්ථකව ලබාගන්නවා / ඉටුකරගන්නවා

Achievement – අචීව්මන්ට් – සාර්ථකත්වය / ලබාගත් දෙය / ජයග්‍රහණය

Improve – ඉම්ප්රූව් – වැඩිදියුණු කරනවා

Improvement – ඉම්ප්රූව්මන්ට් – වැඩිදියුණු වීම

Explain – එක්ස්ප්ලේන් – පැහැදිලි කරනවා

Explanation – එක්ස්ප්ලනේෂන් – පැහැදිලි කිරීම

Decide – ඩිසයිඩ් – තීරණය කරනවා

Decision – ඩිසිෂන් – තීරණය

Create – ක්‍රියේට් – නිර්මාණය කරනවා

Creation – ක්‍රියේෂන් – නිර්මාණය

Observe – ඔබ්ස(ර්)ව් – නිරීක්ෂණය කරනවා

Observation – ඔබ්ස(ර්)වේෂන් – නිරීක්ෂණය

Organize – ඔ(ර්)ගනයිස් – සංවිධානය කරනවා

Organization – ඔ(ර්)ගනයිසේෂන් – සංවිධානය

Communicate – කොමියුනිකේට් – සන්නිවේදනය කරනවා

Communication - කොමියුනිකේෂන් - සන්නිවේදනය

Examine – එග්සැමින් – පරීක්ෂා කරනවා

Examination – එග්සැමිනේෂන් – පරීක්ෂාව / විභාගය

Discover – ඩිස්කව(ර්) – සොයාගන්නවා

Discovery – ඩිස්කවරි – සොයාගැනීම

Develop – ඩිවලොප් – සංවර්ධනය කරනවා / වැඩිදියුණු කරනවා

Development – ඩිවලොප්මන්ට් – සංවර්ධනය

Reduce – රිඩියුස් – අඩු කරනවා

Reduction – රිඩක්ෂන් – අඩු වීම

Increase – ඉන්ක්‍රීස් – වැඩි කරනවා / වැඩි වීම

Measure – මෙෂ(ර්) – මනිනවා

Measurement – මෙෂ(ර්)මන්ට් – මැනීම

Compare – කොම්පෙය(ර්) – සසඳනවා

Comparison – කොම්පැරිසන් – සැසඳීම , උපමාව

Explain - එක්ස්ප්ලේන් - පහදනවා , විස්තර කරනවා

Explanation - එක්ස්ප්ලනේෂන් – පැහැදිලි කිරීම , විස්තර කිරීම

Explainable – එක්ස්ප්ලේනබල් – පැහැදිලි කළ හැකි

Appropriate – ඇප්‍රෝප්‍රියේට් – සුදුසු, ගැළපෙන

Inappropriate – ඉනැප්‍රෝප්‍රියේට් – නුසුදුසු, නොගැළපෙන

Correct – කරෙක්ට් – නිවැරදි

Incorrect – ඉන්කරෙක්ට් – වැරදි

Decent – ඩීසන්ට් – යහපත්, විනීත

Indecent – ඉන්ඩීසන්ට් – අශෝභන, නොහොබිනා

Direct – ඩිරෙක්ට් – සෘජු, කෙලින්

Indirect – ඉන්ඩිරෙක්ට් – වක්‍ර, වක්‍රාකාර

Efficient – ඉෆීෂන්ට් – කාර්යක්ෂම

Inefficient – ඉන්එෆීෂන්ට් – අකාර්යක්ෂම

Sufficient – සෆීෂන්ට් – ප්‍රමාණවත්

Insufficient – ඉන්සෆීෂන්ට් – ප්‍රමාණවත් නොවන